# මුහුණට මුහුණ

## ශ්‍රීනාත් මද්දුමගේ



# ලක්හඬ සැමට පතුරණ ගාමිණී

ඔහු මට මුලින්ම හමුවූයේ මෙයට වසර හතරකට පෙර පාදඩ අසපුව නාට්‍ය කණ්ඩායමත් සමඟ ඔස්ට්‍රේලියාවට පැමිණි වේලාවේ ය. අප නැවතී සිටි බන්ධුරා හි නිහාල් තෙන්නකෝන් සොයුරාගේ ගෙදරට තමාගේ පටිගත කිරීමේ උපකරණ සමඟ අප සොයා පැමිණි ඔහු ගුවන් විදුලි වැඩසටහනක් නිහතමානී ලෙස පටිගත කළ ආකාරය දැනුදු මට මතක ය. කලාකරුවන්ට තමා තුළ ඇති මහත් ආදරය එදා එසේ පෙන්නුම් කළ ගාමිණී ෆොන්සේකා නම් වන මේ ගුවන්විදුලි ශිල්පියා සමඟ වසර හතරකට පසු අද මෙසේ සංවාදයක යෙදෙන්නට මට හැකිවිය.

ගාමිණී



ශ්‍රීනාත් ට අතීතය මතකයි නේද? හුඟක් අයට අතීතය අමතකයිනෙ.

ශ්‍රීනාත්
ඒක මිනිස් ස්වභාවය. අපි ළඟදි ඔබට ලැබුණ සම්මානය ගැන ටිකක් කතා කරමුද?

ගාමිණී
මට මේ වසරේ ලැබුණා සමාජ සේවය හා ජනමාධ්‍ය සඳහා විශිෂ්ට සම්මානය වික්ටෝරියානු බහු සංස්කෘතික කොමිසමෙන් තමයි මේ සම්මානය මට පිරිනැමුවේ.
මං හිතනවා මං මෙතෙක් කල් කරපු යම් මෙහෙවරක් තියෙනවා නම් එයට ලැබීමට සුදුසු නිසි අගැයීම සහ ගෞරවය මට ලැබුණා කියලා.

ශ්‍රීනාත්
මාධ්‍ය වේදියෙකු හැටියට ඔබට ලැබුණ මේ සම්මානය පිළිබඳව මාධ්‍ය ක්ෂෙත්‍රයේ සිටින සියළු දෙනා සමඟම මෙල්බන් සිටින ශ්‍රී ලාංකිකයන් සියලු දෙනා සතුටු වෙනවා නියතයි.
ගාමිණී
මම සමාජ සේවා වැඩ වලට පැමිණියේ අද ඊයේ නෙවෙයි. මම ඔස්ට්‍රේලියාවට ආවෙ 1991 දී. ස්කැට්ස් සංවිධානයේ පළමුවන ලේකම්වරයා හැටියට මම මුලින්ම වැඩ කළා. ඒ එක්කම ඩැන්ඩිනොන්හි ස්ප්‍රිංවේල් නේබර් හුඩ් හවුස් එකට සම්බන්ධ වෙලා එහි පාලක මණ්ඩලයේ විවිධ තනතුරු දැරුවා. දැනට එහි සභාපති හැටියට වසර හතරක කාලයක් සේවය කරනවා.

ශ්‍රීනාත්
අපට කියන්නකෝ ඔබ පවත්වාගෙන යනු ලබන වැඩිහිටි මධ්‍යස්ථානය පිලිබඳව
ගාමිණී
ලක්හඬ වැඩිහිටි මධ්‍යස්ථානය වසර කීපයක් තිස්සේ පවත්වාගෙන එනවා. අපේ මේ වඩසටහනට සෑමදාම වැඩිහිටියන් 20 ක් 25 ක් පමණ සම්බන්ධ වෙනවා. අපි හැම තිස්සෙම බලාපොරොත්තු වන්නේ හුදකලාව සිටින වැඩිහිටියන් සතුටෙන් තබන්නටයි. දවස පුරා පැවැත්වෙන ක්‍රමවත් වැඩසටහනක් අපි ක්‍රියාත්මක කරනවා. පුවත්පත් කියවීම ටෙලි නාට්‍ය හා චිත්‍රපට නැරඹීම ගෘහස්ථ ක්‍රීඩා ආධ්‍යාපනික වැඩ සටහන් ආගමික වැඩ සටහන් ආදී නොයෙක් දේ අපි වැඩිහිටියන් වෙනුවෙන් කරනවා. ඒ එක්කම ඔවිනට දිවා ආහාරයත් සපයනවා. මේ සඳහා ඔවුන්ගෙන් කිසිම මුදලක් අය කරන්නෙ නැහැ. ඔවුනගේ ආහාරපාන සහ පහසුකම් පිළිබඳව නිරතුරුවම සොයා බලන්නේ මගේ බිරිඳ ඉන්ද්‍රා යි. ඇය මගේ කටයුතු වලට විශාල දිරියක් දෙන බිරිඳක්.

ශ්‍රීනාත්
ඔබ ගුවන් විදුලි වැඩ සටහන් වලට සම්බන්ධ වුණේ කොහොමද?
ගාමිණී
මම ලංකාවේදීත් ගුවන් විදුලි ශිල්පියෙකු හැටියට කටයුතු කළා. 1991 ඔස්ට්‍රේලියාවට ආවට පස්සෙ තිලක් විජේවර්ධන මහතා 3''' ගුවන් විදුලියට මාව සම්බන්ධ කර ගත්තා. ඒ එක්කම්"ඊ ගුවන් විදුලියෙත් මුල් කාලයේ වැඩ කළා. මේ වෙලාවෙ මං මතක් කරන්න ඕනෙ මේ සියල්ලටම මට උපකාර කළේ කරු ලියනාරච්චි රමණී ලියනාරච්චි බව. මගේ ලක්හඬ ගුවන් විදුලිය ආරම්භ කළේ 2000 වසරේ දීයි. 88.3 සදර්න් එෆ් එම් 97. ඒ එක්කම ලෝකයේ ප්‍රථම බෞද්ධ වැඩසටහන් පමණක් ප්‍රචාරය කෙරෙන ගුවන් විදුලියක් ආරම්භ කළේ මමයි. මෙය සදහම් හඬ නමින් උදෑසන 6 සිට 7 දක්වා විකාශ වෙනවා.

ශ්‍රීනාත්
ඔස්ට්‍රේලියාවට ආවට පස්සෙ ලංකාවෙ ගුවන්විදුලියට සම්බන්ධ වුණේ නැද්ද?
ගාමිණී
මට සම්බන්ධ වෙන්න අවස්ථාවක් ලැබුණා. 1999

---




## ප්‍රියයන්ගෙන් මිදුණු අයට ශෝකය හෝ බිය ද නැත

සැවැත් නුවර දෙව්රම් වෙහෙරදී

පියතෝ ජායතී ශෝකෝ
පියතෝ ජායතී  භයං
පියතෝ විප්ප මුත්තස්ස
නත්ථි සෝකෝ කුතෝ භයං

ඩූයදේ නිසා සෝක උපදී
ඩුයදේ නිසා බිය ද උපදී
ඩූය දෙයින් වෙන් වූවනට
සෝකයද බියද හට ගන්නේ නැත.

Piyato Jayati Soko
Piyato jayati bhayam
Piyato vippamuttassa
natthi  soko koto bhayam
From endearment springs grief
from endearment springs fear
for him who is wholly free
from endearment there is no grief
much less fear.

සැවැත් නුවර එක පුතකු ඇති පවුලක් දැහැමින් ජීවත් වේ. එම පවුලෙහි අරමුණ වූයේ ඉතා නිරවුල්ව දැහැමි ජීවිතයක් ගත කිරීමටය. සමගියෙන් යුක්ත වූ ඔවුන් සන්සුන්කමින්ද, පිරිසිදුකමින්ද බොහෝදෙනාට ආදර්ශමත් වූහ. දුසිරිතෙන් ඈත් වූ ධාර්මික වූ ඔවුන් ගැන බොහෝදෙනෙක් පැහැදුනහ. තම එකම පුතුගේ හැදීම වැඩීම ගැන දෙමව්පියන් බොහෝ සතුටින් බලා සිටියහ.
පුතු කීකරුය. සුරය. එහෙයින් ඔවුහු සිය කුලයද ධනයද රැකීම සහ මතු දියුණු කිරීමෙහි පුතුගේ සමත් කම් ගැන සලසා සතුටු වෙති. පුතු ගැන බලාපොරොත්තු ද මහත්ය.
මෙසේ බොහෝ කොට බලාපොරොත්තු තබා සිටි එකම පුතු යෞවනයේදීම මරු වසඟයට ගියහ. මහත් ආදරයෙන් සිටි ඒ දෙමව්පියන් දෙදෙනා බොහෝ ශෝක වූහ. හැඬූහ. වැලපුණහ.අවසාන සොහොනෙහිම මළසිරුර  දැවූ තැනට විත් ද හඬති. වැලපෙති. මහත් වූ ශෝකයෙන්ම කල් යැවූහ. දිනක් අළුයම් වේලෙහි පිහිට විය හැකි අයෙක් ගැන බැලූ අප බුදුපියාණන් වහන්සේට මේ සෝකයෙන් වැලපෙන මව්පිය දෙපල දුටුසේක. ඔවුන් හට සෝවාන්වීමට පින් ඇති නිසා බුදුපියාණන් වහන්සේ ඔවුන්ගේ නිවසට වැඩමවා මේ වැළපෙන මව්පිය දෙපලට දහම් දෙසූසේක.
එම ධර්ම දේශණයේ බුදුපියාණන් වහන්සේ විසින් ඩූයයන් නිසා (හිතවත් අයගේ වෙන්වීම, නැතිවීම හේතුකොට ගෙන) ශෝකය සහ බිය උපදින බවත්, ඩූයයන් ගෙන් වෙන් වූ අය හට (රහතන් වහන්සේලාට) ශෝකයද, බියද නැති බව වදාළා. එම පියා සහ මව සෝවාන් මාර්ග ඵලයෙහි පිහිට වූ සේක.




## 2550 ශ්‍රී බුද්ධ ජයන්තිය සැමරීම සඳහා සිදුකෙරෙන විශේෂ බුද්ධ පූජාව සහ ශීල ව්‍යාපාරය.

ඩැන්ඩිනොන් ධර්මදීපාරාමයේ අධිපති අකරවිට සංඝානන්ද හිමිපානන් විසින් ප්‍රදේශවාසී බෞද්ධාගමික පින්වතුන්ගේ සහයද ලබාගෙන සංවිධානය කරනු ලබන විශේෂ පින් කමක් අප්‍රේල් 28 වන දා ඩැන්ඩිනොන් හි ඩවුටන් ප්‍රජා ශාලාවේදී පැවැත්වෙයි.

පෙව 8.30 සිට පස්වරු 3 දක්වා පැවැත්වෙන මෙම පුණ්‍යෝත්සවයේ වැදගත්ම අංගය වන්නේ ඔස්ට්‍රේලියාවේ සියලුම ආහාර වර්ග වලින් පරිපූර්ණව සිදු කරන විශේෂ බුද්ධ පූජාවයි. එදින දවස පුරා බුදු ගුණ සිහි කරමින් ශීල ව්‍යාපාරයක් පැවැත්වෙන අතර මෙම පූජාව සඳහා සහභාගි වීමට කැමති පින්වතුන් සුදු ඇඳුමින් සැරසී පිච්ච මල් රැගෙන එම ස්ථානයට පැමිණෙන ලෙස විහාරාධිපති හිමියෝ දන්වා සිටිති.